---

කාරතිවු ප්‍රාදේශිය සභාව

අම්පාර දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 09 දින විගණන සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 10 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 අගෝස්තු 14 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කාරතිවු ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් ,මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට කාරතිවු ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආරම්භක සමුච්චිත ශේෂය ගිණුම් වල රු.283,600 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) ටෙන්ඩර් තැන්පතු රු.78,907 ක් ආපසු නොගෙවා දීර්ඝ කාල පරිච්ඡේදයක් තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඇ) 2006 වර්ෂයේ සිට ආදායමට බැර කළ යුතු රු.1,138,064 ක් වූ තැන්පතු මේ දක්වා ආදායමට බැර කර නොතිබුණි.

(ඈ) 2009, 2010 සහ 2011 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර බදු ගණනය කර ගිණුම්වලට ගෙන නොතිබුණි .

## 2 මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.5,271,906 ක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.1,834,734 ක් විය .

### 2.2 මූල්‍ය පාලනය

පහත සඳහන් මූල්‍ය පාලන අඩුපාඩු නිරික්ෂණය විය .

(අ) පොදු වෙළඳ පොල සහ මස් වෙළඳ සැල් සඳහා සභාව වෙත ලැබිය යුතු වූ රු. 437,936 ක් වූ හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි .

(ආ) රු. 611,393 ක් වූ එකතු කළ අගය මත බදු සහ රැඳවුම් බදු දේශිය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය නොකොට තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි .

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| (i) | වරිපනම් සහ බදු | 5 | - | - |
| (ii) | බදු කුලී | 1,659 | 784 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 7,190 | 10,965 | - |
| (iv) | වෙනත් ආදයම් | 14,660 | 111,767 | 9,431 |

#### 2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා ගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් උසාවි දඩ සහ මුද්දර ගාස්තු ලෙස 2011 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.4,431,615 ක් සහ රු.453,550 ක් අයවිය යුතුව තිබුණි.

## 2.4 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

2011 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| විධායක ශ්‍රේණි | - | 01 |
| සහායක ශ්‍රේණි | 06 | 12 |
| සුළු ශ්‍රේණි | 07 | 07 |
| වෙනත් | - | 09 |
| | 13 | 29 |

## 2.5 සේවක ණය

සභාවේ නිලධාරින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු.34,492 ක් වූ සේවක ණය අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

## 2.6 අභ්‍යන්තර විගණනය

සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

# 3 . පද්ධති හා පාලන

---

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය